✓ ඇමුණුම - 02


**අධ්‍යාපන අමාත්‍යාංශය**
**கல்வி அமைச்சு**
**Ministry of Education**

'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
'இசுருபாய', பத்தரமுல்லை, இலங்கை.
'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50 · +94112784846
isurupaya@moe.gov.lk · www.moe.gov.lk


මගේ අංකය / எனது இல. / My Ref. : ED/01/101/02/02/01-2019 ― ඔබේ අංකය / உமது இல. / Your Ref. : ― දිනය / திகதி / Date : 2019.05.27

අමාත්‍යාංශ චක්‍රලේඛ : 36/2018 ( I )

සියලුම පළාත් අධ්‍යාපන ලේකම්වරුන්,
සියලුම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියලුම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියලුම කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියලුම පළාත්/කලාප ගණිත විෂය භාර නියෝජ්‍ය/සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියලුම පරිවෙනාධිපතිවරුන් සහ
සියලුම විදුහල්පතිවරුන් වෙත.

**සමස්ත ලංකා ගණිත තරගාවලිය**

ඉහත කරුණට අදාළව නිකුත් කරන ලද 2018.09.18 දිනැති අමාත්‍යාංශ චක්‍රලේඛ 36/2018 කෙරෙහි ඔබගේ අවධානය යොමු කරමි.

එකී චක්‍රලේඛයේ 3.2 උප වගන්තිය සහ 3.3 හි 3.3.1 උප වගන්තියෙහි තරග අදියර 04 (Maths Quiz) වගන්තිය පහත පරිදි සංශෝධනය කරමි.

**3.2 සහභාගිත්වය**

ජ්‍යෙෂ්ඨ -2 තරග අංශය සඳහා සහභාගී කරවිය යුත්තේ ඉදිරි වර්ෂවල දී අ.පො.ස.(උ.පෙළ) විභාගයට පළමුවරට පෙනී සිටින පාසල් සිසුන්ය.

**තරග අදියර 04 (Maths Quiz)**

මෙම තරගය මිනිත්තු 90 ක කාලයක් තුළ පැවැත්වෙන අතර තරග වට දෙකක් පැවැත්වේ. මෙම තරගයට සහභාගි විය හැක්කේ කණ්ඩායමේ හයදෙනෙකුට පමණි. අනෙක් සිසුන් අතිරේක තරගකරුවන් වේ. එක් තරගකරුවෙකුට එක් වටයක දී එක් ප්‍රශ්නය බැගින් ප්‍රශ්න වට 2ක් පැවැත්වේ. එක් තරගයක් සඳහා කණ්ඩායම් තුන බැගින් ස්ථාන තුනක දී පැවැත්වේ.

එසේ ම, 36/2018 චක්‍රලේඛයේ අනිකුත් කොන්දේසි හා විධිවිධාන නොවෙනස්ව පවතී.

තිස්ස හේවාවිතාන
ලේකම් (වැ.බ.)
අධ්‍යාපන අමාත්‍යාංශය